# අධ්‍යාපන අමාත්‍යාංශය

## ලංසු සඳහා ආරාධනයයි

## ප්‍රධාන ආපනශාලාව සඳහා නව සේවා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම 2023/2024

1.අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් <u>වසරක කාලයක් සඳහා</u> “ඉසුරුපාය” අධ්‍යාපන අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ බිම් මහලේ භෝජනාගාර සංකීර්ණය තුළ පිහිටා ඇති A හා B කොටස් ප්‍රධාන ආපනශාලාව ලෙස පවත්වාගෙන යාම සඳහා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද සහිත යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2.මෙ සඳහා උනන්දුවක් දක්වනු ලබන ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයේ 05 වන මහලේ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබා ගත හැකි අතර <u>2023.09.13 දින සිට 2022.09.26</u> දින දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 08.30 - ප.ව.03.00 අතර ලංසු ලියවිලි නොමිලේ පරීක්ෂා කළ හැකිය.

3.ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර හා ආපසු නොගෙවන රු.<u>2,000.00</u> ක ගාස්තුවක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් අංශයේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් පසු මෙම ලංසු ලිපිලේඛන කට්ටලයක් <u>2023.09.26</u> දින දක්වා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ලබා ගත හැකිය.

4.ලංසු භාරගැනීම 2023.09.27 දින පෙ.ව. 11.00 ට අවසන් කෙරේ. නිසිලෙස සම්පූර්ණ කරන ලද මුද්‍රා තැබූ ලංසු, කවරයක බහා එහි වම්පස ඉහළ කෙලවරේ ප්‍රධාන ආපනශාලාව සඳහා නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීම 2023/2024 යනුවෙන් සඳහන් කොට <u>2023.09.27</u> වන දින පෙ<u>.ව.11.00</u> ට පෙර ලැබෙන පරිදි

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රසම්පාදන අංශය,
5 වන මහල,
ඉසුරුපාය, බත්තරමුල්ල.

වෙත ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය යුතුය.

5.ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ අවසන් වේලාව අවසන්වූ වහාම ඉහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට සහභාගිවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්/ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා 0112785573 අංකය අමතන්න.

ලේකම් ,
අධ්‍යාපන අමාත්‍යාංශය

Scanned with
MOBILE SCANNER